ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රවෘත්ති සංස්කාරක

2024 පෙබරවාරි 13

මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි ආර්ථික අර්බුදයේ බලපෑම තක්සේරු කිරීමේ සමීක්ෂණය - 2023

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්,ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය :011-2147414 ෆැක්ස් : 011-2877945 ඊමේල් : industries@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි කෝවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදයේ බලපෑම මැන බැලීම සඳහා ආයතන මට්ටමේ සමීක්ෂණයක් 2023 මාර්තු සිට ජූනි මස දක්වා පවත්වන ලදී. මෙම සමීක්ෂණය මගින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු සිදුකරනු ලබන ව්‍යාපාරික ස්ථාන ආවරණය කරන ලද අතර ඊට කර්මාන්ත, වෙළඳ හා සේවා යන සියළුම අංශ ඇතුළත්ය.

2013 වසරේ පැවති ආර්ථික සංගණනයේ දත්ත පාදක කර ගනිමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ව්‍යාපාරයක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණය තීරණය කිරීමේ නිර්ණායකයන් මෙම සමීක්ෂණය සඳහා භාවිතා කරන ලදී. එම නිර්ණායකයන් වගු අංක 1 න් දක්වා ඇත.

වගු අංක 1: ව්‍යාපාරයක පරිමාණය තීරණය කෙරෙන නිර්ණායක

ප්‍රධාන ආර්ථික කටයුත්ත	**ව්‍යාපාරයේ පරිමාණය**	**නිර්ණායකය (සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාව අනුව)**
කර්මාන්ත හා ඉදිකිරීම්	ක්ෂුද්‍ර	1 - 4
	කුඩා	5 - 24
	මධ්‍ය	25 - 199
වෙළඳ	ක්ෂුද්‍ර	1 - 3
	කුඩා	4 - 14
	මධ්‍ය	15 - 34
සේවා	ක්ෂුද්‍ර	1 - 4
	කුඩා	5 - 15
	මධ්‍ය	16 - 74

ක්ෂුද්‍ර අංශය යටතේ,

- ත්‍රිරෝද රැකියාව කරන පුද්ගලයෙකු
- කුඩා සිල්ලර කඩයක් පවත්වා ගෙන යනු ලබන පුද්ගලයෙකු
- කොණ්ඩා කපන ස්ථානයක් පවත්වාගෙන යන පුද්ගලයෙකු
- කොන්ත්‍රාත් පදනම මත ඉදිකිරීම් කටයුතු කරගෙන යන පුද්ගලයෙකු

වැනි අයද මේ සමීක්ෂණයේ ආවරණ කලාපයට ඇතුළත් කරගන්නා ලදී.

මෙම ආයතනික සමීක්ෂණය හරහා 2018 වසරේ සක්‍රීයව පැවති උක්ත ව්‍යාපාර වලින් 2018 වසරේ සිට 2022 වසර අවසානය දක්වා ඒ ඒ ව්‍යාපාරයන්ට අදාල වන තොරතුරු එක්රැස් කරන ලදී. නමුත් එකී කාල පරිච්ඡේදය තුළ අඵතින් අරඹන ලද ව්‍යාපාර මෙම සමීක්ෂණයේ ආවරණ කලාපයට ඇතුළත් නොවේ.

වගු අංක 2: 2018 වසරේ සක්‍රීයව පැවති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර, 2023 මැයි මස වන විට පැවති තත්ත්වය

තත්ත්වය	ව්‍යාපාර සංඛ්‍යාව (000')	%
ක්‍රියාත්මක	1,037.1	79.8
තාවකාලිකව වසා ඇති	59.1	4.5
ස්ථිරව වසා ඇති	204.1	15.7
එකතුව	**1,300.3**	**100.0**

2018 වසර අවසානයේ සක්‍රීයව පැවති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව මිලියන 1.3 වන බව වාර්තා විය. ඒ අතරින් 79.8% ක් සමීක්ෂණය සිදුකරනු ලැබූ කාලපරිච්ඡේදය (2023 මැයි) වන විට ද සක්‍රීයව පැවති බව ද සෙසු 20.2% ක ව්‍යාපාර ස්ථිරව හෝ තාවකාලිකව වසා දමා ඇති බව ද හෙළි විය.

තාවකාලිකව හෝ ස්ථිරව වැසී ඇති ව්‍යාපාර වලින් වැඩිමනත් නොරතුරු ලබාගැනීම අසීරු කටයුත්තක් වුව ද, සමීක්ෂණයේදී ඒවා වසා දමන ලද වසර පිළිබඳව විමසන ලදී.

ඒ අනුව වසා දමන ලද වසර පිළිබඳව නොරතුරු ලබාගැනීමට හැකි වූ ව්‍යාපාරික ස්ථාන අතරින් 2019 සිට සමීක්ෂණය සිදුකෙරුණු කාලවකවානුව දක්වා එක් එක් වසර තුළ තාවකාලිකව හෝ ස්ථිරව වැසීගිය ව්‍යාපාර වල ප්‍රතිශතයන් පහත වගුවේ දැක්වේ.

වගු අංක 3: 2018 සිට 2023 මැයි මස දක්වා වැසී ගිය (තාවකාලිකව හෝ ස්ථිරව) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර වල ප්‍රතිශත ව්‍යාප්තිය

වැසීගිය වසර	%
2019	9.9
2020	33.4
2021	27.4
2022*	29.3
2018 සිට 2022 දක්වා	**100.0**

* 2022 වසරෙන් පසු 2023 මැයි මස දක්වා කාල පරාසය තුළ වැසී ගිය ව්‍යාපාර සංඛ්‍යාව ද 2022 වසරට එකතු කරන ලදී.

සාපේක්ෂව අඩු ස්ථාවරත්වයක් දක්වන ක්ෂුද්‍ර පරිමාණයේ ආයතන වැසීයාම වසංගත හෝ ආර්ථික අර්බුද වැනි සාධක මත පමණක් සිදු නොවන බව 2019 වසර තුළ වැසීගිය 9.9% ක ප්‍රමාණයෙන් පෙන්නුම් කෙරේ. නමුත් කෝවිඩ් වසංගතයත්, ආර්ථික අර්බුදයත් නිසා සමස්ත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර තාවකාලිකව හෝ ස්ථිරව වැසීයාම සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.

වගු අංක 4: 2018 වසරට සාපේක්ෂව 2022 වසර දක්වා සංඛ්‍යාත්මකව ව්‍යාපාර වල වෙනස්වීම

දර්ශකය	පරිමාණය	2018	2019	2020	2021	2022
ව්‍යාපාර සංඛ්‍යාව (දහස් වලින්)	ක්ෂුද්‍ර	934.2	942.8	982.6	972.6	948.9
	කුඩා	88.4	82.1	48.4	58.3	80.8
	මධ්‍ය	14.5	12.2	6.1	6.2	7.5
	එකතුව*	**1037.1**	**1037.1**	**1037.1**	**1037.1**	**1037.1**
2018 ට සාපේක්ෂව ව්‍යාපාර සංඛ්‍යාවේ වෙනස්වීම (%)	ක්ෂුද්‍ර	100.0	100.9	105.2	104.1	101.6
	කුඩා	100.0	92.8	54.8	66.0	91.3
	මධ්‍ය	100.0	84.3	42.0	42.5	51.7
	එකතුව	**100.0**	**100.0**	**100.0**	**100.0**	**100.0**

* 2018 සිට 2022 දක්වා සක්‍රීයව පැවති ව්‍යාපාර සංඛ්‍යාව සළකන ලදී

වගු අංක 1 ට අනුව, කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ ව්‍යාපාර සංඛ්‍යාවේ සැළකියයුතු අඩුවීමක් 2018 වසරට සාපේක්ෂව 2020 වසර තුළ දක්නට ලැබේ.

කුඩා පරිමාණ ව්‍යාපාර ප්‍රමාණයේ අඩුවීම 2019 දී දහස් 82.1 සිට 2020 දී දහස් 48.4 දක්වා වී ඇති අතර මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව, 2019 දී දහස් 12.2 සිට 2020 දී දහස් 6.1 දක්වා සියයට 50 කින් පසුබැස ඇත. කුඩා පරිමාණ අංශයේ ව්‍යාපාර ප්‍රමාණය 2021 වසරේදී දහස් 58.3 දක්වා සුළු වැඩිවීමක් ද, 2022 වසර වන විට දහස් 80.8 දක්වා වැඩිවීමක් ද පෙන්නුම් කර ඇත. මෙවැනිම රටාවක් මධ්‍ය පරිමාණ අංශයේත් නිරීක්ෂණය වන අතර ප්‍රමාණාත්මකව එය 2021 වසරේදී දහස් 6.2 සහ 2022 වසරේදී දහස් 7.5 වශයෙන් විය. කෙසේවෙතත් මෙම වර්ධනය 2018 වසරේ පැවති මට්ටමට ළඟා වීමට තරම් ප්‍රමාණවත් නොවේ.

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර වල සැලකිය යුතු වැඩි වීමක් 2018 සිට 2020 දක්වා නිරීක්ෂණය විය. ව්‍යාපාරයක පරිමාණය එනම් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණද යන වග තීරණය කිරීමේදී එම ව්‍යාපාරය සතු සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව තීරණාත්මක සාධකයකි. කෝවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය නිසා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සේවකයින් අඩුකිරීම හේතුවෙන් ඇතැම් ව්‍යාපාර වල පරිමාණය ක්ෂුද්‍ර පරිමාණය දක්වා පහළ බැස ඇත. 2018 වසරට සාපේක්ෂව 2020 සිට 2022 දක්වා 2018 ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර වල සැළකිය යුතු වර්ධනයට උක්ත හේතුව ද ප්‍රබල සාධකයක් වී ඇත.

2018 වසරේ පැවති මට්ටමට සාපේක්ෂව, 2018 සිට 2022 දක්වා ව්‍යාපාර සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස වෙනස් වී ඇති ආකාරය පහත ප්‍රස්තාර අංක 1න් දැක්වේ.

ප්‍රස්තාර අංක 1: 2018 වසරට සාපේක්ෂව 2022 වසර දක්වා ව්‍යාපාර වල ප්‍රතිශත වෙනස



වගු අංක 5: 2018 වසරට සාපේක්ෂව 2022 වසර දක්වා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල සේවා නියුක්තිකයන්ගේ වෙනස්වීම

දර්ශකය	පරිමාණය	2018	2019	2020	2021	2022
සේවා නියුක්තිකයන් සංඛ්‍යාව (දහස් වලින්)	ක්ෂුද්‍ර	1637.8	1635.2	1.686.7	1644.7	1673.3
	කුඩා	673.3	630.5	414.6	456.2	586.3
	මධ්‍ය	485.5	414.4	262.4	266.1	291.6
	එකතුව	**2796.6**	**2680.1**	**2363.7**	**2367.0**	**2551.2**
2018 ට සාපේක්ෂව සේවා නියුක්තිකයන් සංඛ්‍යාවේ වෙනස්වීම (%)	ක්ෂුද්‍ර	100.0	99.8	103.0	100.4	102.2
	කුඩා	100.0	93.6	61.6	67.8	87.1
	මධ්‍ය	100.0	85.4	54.0	54.8	60.1
	එකතුව	**100.0**	**95.8**	**84.5**	**84.6**	**91.2**

වර්ෂ 2018 සිට 2020 දක්වා ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර වල ශ්‍රම බලකාය දහස් 1,637.8 ක සිට දහස් 1,686.7 දක්වා වැඩි වී ඇත. එම සංඛ්‍යාව 2020 ට සාපේක්ෂව 2021 වසරේදී දහස් 1,644.7 දක්වා මදක් අඩු වූ අතර 2022 වන විට නැවතත් දහස් 1,673.3 දක්වා වර්ධනය වී ඇත.

ක්ෂුද්‍ර පරිමාණ ව්‍යාපාර වල සේවා නියුක්තිය වැඩිවීම කෙරෙහි ව්‍යාපාර පරිමාණයේ මාරුවීම් වැඩි දායකත්වයක් දක්වා ඇති බව මෙම ප්‍රතිඵල වලින් පැහැදිලි වේ.

කෙසේ වෙතත්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වඩා වැඩි අභියෝගවලට මුහුණ දී ඇත. කුඩා පරිමාණ ව්‍යාපාර සළකන විට, 2018 දී එම අංශයේ සේවා නියුක්තිකයින් සංඛයාව දහස් 673.3 ක සිට 2020 දී දහස් 414.6 දක්වා පහත වැටී ඇත. ඒ හා සමානවම, වර්ෂ 2018 දී මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර වල ශ්‍රමිකයන් දහස් 485.5 ක ප්‍රමාණයක් රැකියා වල නියුක්තව සිටි අතර එම සංඛ්‍යාව 2020 දී දහස් 262.4 දක්වා පසුබැසීමකට ලක්ව ඇත.

2020 න් පසු අංශ දෙකෙහිම සුළු ප්‍රගතියක් දක්නට ලැබුණු නමුත් වසංගත හා ආර්ථික අර්බුදයේ බලපෑම හමුවේ 2022 අවසාන වන තුරුත් 2018 වසරේ පැවති මට්ටමට ළඟා වී නොමැත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව